LIBRARY



# රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් ගැන දත්ත රැස්කර ගැනීමේ වැඩපිළිවෙළක්

**ඉන්දික හේවාවිතාරණ**

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ ප්‍රජා විද්‍යා සාමාජික හා ආර්ථික දත්ත රැස්කර ගැනීමේ වැඩපිළිවෙළක් සකස් කර ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

මේ සඳහා මේ මස 17 වැනිදා උදෑසන 7.30 - 11.30 කාලය තුළ වෙබ් පිටුවක් හරහා සහ අයදුම්පත් සම්පූර්ණ කිරීමේ සංගණනයක් සිදුකරන බව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මහතා සඳහන් කළේය.

වෙබ් පිටුවට තොරතුරු ලබාදීමට නොහැකි අයට ආයතන ප්‍රධානීන්ට ලබා දී තිබෙන ප්‍රශ්නාවලියට පිළිතුරු සපයා මෙම සංගණනයට සහභාගි විය හැකි බවද ඔහු පවසා සිටියේය.

මෙම කාලය තුළදී දත්ත ලබාදීමට නොහැකි වන අයට ඊට පෙර දත්ත ඇතුළත් කළ හැකි බවද අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කළේය.

මෙම ප්‍රශ්නාවලිය www.statistics.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකි බවද ඒ මහතා කියා සිටියේය.

ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යවලින් හා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් මෙම වෙබ් අඩවිය තුළ තොරතුරු ඇතුළත් කර තිබෙන බවද හෙතෙම පවසා සිටියේය.